## 19. ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය

---

### 19.1 විගණන විෂය පථය

---

පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 11 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිර්ක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 19.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 19.3 විගණන නිරීක්ෂණ

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) යටතේ දක්වා ඇති පොදු නිරීක්ෂණය

සහ පහත 19.4 සිට 19.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 19.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

----------------------------------------

### 19.4.1 සංයුක්ත සැලැස්ම

--------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 19.4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 19.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

**19.5 වත්කම් කළමනාකරණය**

**බේරුම් නොකළ බැරකම්**

කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.723,225 ක් වූ අතර, එම ශේෂය වර්ෂයකට අඩු කාල පර්ච්ඡේදයකට අදාල විය.

**19.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ආයතන සංග්‍රහය** | | |
| (i) V පරිච්ඡේදයේ 7 වගන්තිය | - | කාර්යාලයේ සම්බන්ධීකරණ ලේකම්වරියක් 2012 සැප්තැම්බර් 04 දින සිට 2012 ඔක්තෝබර් 07 දින දක්වා කාලපර්ච්ඡේදය තුළ සේවයට වාර්තා කර නොතිබුණු අතර විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගැනීමද සිදුකර නොතිබුණි. නිලධාරිනිය මෙම කාලය තුළදී අනුමැතියකින් තොරව විදේශ ගත වී තිබුණ බවත් එම කාලයට අදාල සම්පූර්ණ වැටුප් හා දීමනා ලෙස රු. 70,770 ක් ලබාගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. |
| (ii) xxviii පර්ච්ඡේදයේ 1.3 වගන්තිය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සෑම නිලධාරියකුම පැමිණෙන හා පිටත්ව යන වේලාව ස්වකීය අත්සනද සහිතව සටහන් කළ යුතු වුවත්, නිලධාරීන් තිදෙනෙකු පමණක් කිසිදු දිනයක කාර්යාලයේ පවත්වාගෙන යන පැමිණීමේ ලේඛණයේ පැමිණීම හා පිටවීම |

| | | |
|---|---|---|
| | | සටහන් කර නොතිබුණි. සෑම අවස්ථාවකදීම නියමිත අයුරින්ම පැමිණීම හා පිටවීම පිළිබඳ රෙගුලාසි අනුගමනය කිරීම අපහසු බවත් රජයේ කාර්යාලයකට වුවද මෙවැනි කරුණු පිළිබඳව යථාවාදීව සළකා බැලිය යුතු බවත් විපක්ෂ නායක කාර්යාලයේ ලේකම් මා වෙත දන්වා එවා තිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි

----------------

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 102 - 110 | 500,000 | වාහන අනතුරකින් සිදු වූ අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබූ අතර වාහන අනතුරු පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමට හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 262 (2) | 320,291 | ගෙවීම් වවුචර් වල හා ඒවා තහවුරු කරන ලියවිලිවල ගෙවන ලදී මුද්‍රාව යොදා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | - | මෝටර් වාහනවල දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

------------------------

| | | |
|---|---|---|
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 1,366,518 | විදේශ සංචාරවලදී ගුවන් ටිකට්පත් මිලදී ගැනිම ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම හෝ මිහින්ලංකා සමාගමින් කළ යුතු වුවත් එම විධිවිධාන වලට පටහැනිව කටයුතු කර තිබුණි. |

(ඈ) ජාතික අයවැය චක්‍රලේඛ

------------------------

| | | |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.3- 1.1.7 දක්වා ඡේද | 905,130 | ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල කාලය තුළදී මාසික ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කර නොතිබුණි. |

**19.7 මානව සම්පත් කළමනාකරණය**
**-------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**
**-----------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | 2 | 1 |
| (ආ) තෘතියික මට්ටම | 11 | 6 | 5 |
| (ඇ) ද්විතියක මට්ටම | 21 | 19 | 2 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 17 | 15 | 2 |
| (ඉ) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 10 | 10 | - |
| එකතුව | 62 | 52 | 10 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.